# GOVERNMENT INTERVENTIONS TO THE MARKET (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට රජය මැදිහත් වීම

ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළෙඳපොළ සමතුලිතය මගින් සමාජයක් තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරිමේ සහ බෙදාහැරීමෙහිලා කිසියම් ආකාරයක වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

එසේ වුව ද සමාජීය, දේශපාලන හා ආර්ථික දෘෂ්ටිකෝණවලින් බලා මෙම වෙළෙඳපොළ සමතුලිතය සමාජයට අහිතකර වේ යැයි යන විවිධ මත පළ කෙරේ.

ClassWork.LK

# නිදහස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට රජය මැදිහත් වන විවිධ ස්වරූප

මෙලෙස වෙළෙඳපොළට රජය මැදිහත් වන ප්‍රධාන ආකාර කිහිපයක් පහත දැක්වේ.

- බදු පැනවීම
- සහනාධාර ලබා දීම
- මිල පාලනය
- මිල ස්ථායිකරණය

ClassWork.LK

# <u>බදු පැනවීම</u>

වෙළෙඳපොළ ක්‍රියාවලියට ආණ්ඩුව මැදිහත් වන සුලබ ම ආකාරයක් වන්නේ නිෂ්පාදකයන්ගෙන් හා පාරිභෝගිකයන් ගෙන් **බදු අය කිරීම** යි.

විවිධ අරමුණු ඇති ව ආණ්ඩුව බදු අය කිරීම් සිදු කරන අතර නිෂ්පාදනය හෝ පරිභෝජනය කරනු ලබන ඒකකයක් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක බදු අය කිරීම හෝ භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අය කිරීම හෝ ලෙසින් බදු අය කිරීමේ ප්‍රධාන ස්වරූප දෙකක් දැකිය හැකි ය.

මෙලෙසින් බදු අය කිරීම් නිසා ඉල්ලුම්, සැපයුම් තත්ත්ව වෙනස් වන බැවින්, ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළෙඳපොළ සමතුලිතයෙහි වෙනස්කම් හට ගනී.

ClassWork.LK

# සහනාධාර ලබා දීම

බදු අය කරන්නා සේ ම රජය නිෂ්පාදකයන්ට හා පාරිභෝගිකයන්ට සහනාධාර දීම ද සිදු කරයි.

සහනාධාර දීම් නිසා ද ඉල්ලුම්, සැපයුම් තත්ත්ව වෙනස් වන බැවින්, ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළෙඳපොළ සමතුලිතයෙහි වෙනස්කම් හට ගනී.

ClassWork.LK

# මිල පාලනය

බදු අය කිරීම් හා සහනාධාර ලබා දීම් හැරුණු විට රජය මිල ප්‍රතිපත්ති මගින් ද, ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වූ සමතුලිත අගයන් වෙනස් කරන අවස්ථා ද පවතී.

මිල ප්‍රතිපත්ති යටතේ පාලනය කරන ලද මිල ගණන් හඳුන්වා දීම වර්තමානයේ විවිධ ආණ්ඩු විසින් අනුගමනය කරනු ලබන සුලබ ක්‍රියාමාර්ගයකි.

එහි දී ආණ්ඩුව නීති මගින් මිල නියම කිරීමේ කාර්යයට අවතීර්ණ වීමක් සිදු කරන අතර ඒ නිසා වෙළෙඳපොළ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය නිෂ්ක්‍රිය වීමක් සිදු වේ.

## මිල පාලන ප්‍රතිපත්තිවල ස්වරූප

නීති මගින් ආණ්ඩුව නියම කරනු ලබන මිල පාලන ප්‍රතිපත්තිවල ස්වරූප දෙකකි.

- උපරිම මිල සීමා නියම කිරීම
- අවම මිල සීමා නියම කිරීම

ClassWork.LK

# මිල ස්ථායිකරණය

නිෂ්පාදිත භාණ්ඩවල මිල ගණන් නිරන්තරයෙන් උච්චාවචනය වනවිට ආර්ථිකය තුළ මිල අස්ථායීතාවයක් හට ගනී.

එවැනි මිල අස්ථායීතාවයන් වැළැක්වීම අරමුණු කර ගෙන ආණ්ඩු විසින් විවිධ මිල ස්ථායිකරණය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ClassWork.LK



පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ECONOMICS
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු 27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura